**ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව - 2022**

**-------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය, ශුද්ධ වත්කම් වෙනස්වීම පිළිඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2022 දෙසැම්බර් 31 දිනට ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන

තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති වීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදු වන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදු වන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූෂ්‍යසන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු. 411,213 ක් වැඩියෙන් දක්වා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී ද එය නිවැරදි කිරීමට කටයුතු කර නොතිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදි නිවැරදි කරන බව. | ගිණුමේ ශේෂයන් නිවැරදිව ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | සභාව විසින් මිලදීගෙන තිබූ රු. 453,320 ක් වටිනා වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදි නිවැරදි කරන බව. | වත්කම් ප්‍රාග්ධනිත කළ යුතුය. |
| (ඇ) | සභාව විසින් සමාලෝචිත වර්ෂය තුළ රු.550,990 ක ප්‍රාග්ධන වත්කම් මිලදීගැනීම් පුනරාවර්තන වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි. | ඉදිරියේ දී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට කටයුතු කරන බව. | වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඈ) | කසල මධ්‍යස්ථානයේ ප්‍රවේශ මාර්ගය කැටගල් අල්ලා සකස් කිරීමට දරන ලද රු.1,499,418 ක වියදම ඉඩම් හා ගොඩනැගිලි යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදි නිවැරදි කරන බව. | ප්‍රාග්ධන වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | කීර්තිපුර ක්‍රීඩාපිටිය වටා වැට හා ගේට්ටු ඉදිකිරීම කර්මාන්තයේ වියදම ප්‍රාග්ධනිත කිරීමේදී රු.295,088 ක ප්‍රාග්ධන වියදම් කොටස පමණක් ප්‍රාග්ධනිත කළ යුතු වුවත්, රු.681,572 ක් වූ අයභාර වියදම් කොටසද ඇතුළත් කර ප්‍රාග්ධනිත කර තිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදි නිවැරදි කරන බව. | ප්‍රාග්ධන වියදම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු රු. 2,164,820 ක වැටුප් ප්‍රතිපූර්ණ ගිණුම්ගත කර නොතිබුණු අතර 2020 වර්ෂයට අදාළව සමාලෝචිත වර්ෂයේදී ලැබී තිබූ රු.1,000,000 ක වැටුප් ප්‍රතිපූර්ණය වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම් ගත කර තිබුණි. | 2023 වර්ෂයේ අවසන් ගිණුම සකස් කිරීමේදි නිවැරදි කරන බව. | ලැබිය යුතු ශේෂ හා ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |

**1.6.2 නොසැසඳු පාලන ගිණුම්**

| විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් එකතුව රු. 11,849,765 ක් වූ ගිණුම් විෂයයන් 09 කට අදාළ ශේෂ සහ ඊට අදාළ උපයෝගී ලේඛන/ උපලේඛනවල දැක්වෙන ශේෂ අතර එකතුව රු. 2,667,359 ක අසමානතා පැවතුණි. | අතපසු වීම්, අත්හැරීම් හා එකතු කිරීමේ දෝෂ වෙනසට හේතු වු බව. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම නිවැරදි කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණ | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ස්ථාවර තැන්පතුවක සමාලෝචිත වර්ෂය අවසානයට වටිනාකම රු. 635,224 ක් ලෙස දක්වා තිබුණද ස්ථාවර තැන්පතුවට අදාළව තැන්පතු සහතිකය විගණනයට ඉදිරිපත් නොවීය. | තැන්පත් සහතිකය ලබාගැනීමට කටයුතු කරන බව . | ස්ථාවර තැන්පතු සහතිකය විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය | ප්‍රධාන කාරණා 30 ක් ඉටුකිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත්, 2022 දෙසැම්බර් 31 දින වන විටත් කාරණා 28 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන තිබුණි. | පනවා නොගත් කාරණා සඳහා ඉදිරියේදී අතුරු ව්‍යවස්ථා සකස් කිරීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 177 (1) | සභාවේ සේවයේ නියුතු ආදායම් පරීක්ෂක විසින් 2022 වර්ෂයේ අවස්ථා 21 කදී රැස්කළ රු. 58,900 ක පොළ බදු ආදායම් නිසි පරිදි කාර්යාලයට ප්‍රේෂණය නොකර ආදායම් රැස්කළ දින සිට දින 01 ත් දින 57 ත් අතර කාලයක් අතරඳවාගෙන සිට කාර්යාලයට ප්‍රේෂණය කර තිබුණි. | ආදායම් පරීක්ෂක වෙත අවවාදාත්මක ලිපියක් නිකුත් කළ බවත්, මුදල් ප්‍රේෂණය කිරීම පරීක්ෂාවට ලක් කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 910,950 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 1,098,417 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කල ආදායම්, රැස්කල ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2022 ඇස්තමේන්තු ගත ආදායම | 2022 බිල් කළ ආදායම | 2022 රැස් කළ ආදායම | 2022 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2021 ඇස්තමේන්තු ගත ආදායම | 2021 බිල් කළ ආදායම | 2021 රැස් කළ ආදායම | 2021 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වෙනත් බදු | 530,000 | 692,800 | 635,120 | 154,760 | 455,000 | 531,580 | 464,500 | 97,080 |
| කුලී | 6,045,000 | 3,377,183 | 3,462,646 | 1,386,296 | 4,626,600 | 5,544,516 | 4,529,843 | 1,471,759 |
| බලපත්‍ර ගාස්තු | 1,348,200 | 1,720,235 | 1,790,685 | 1,395,340 | 850,000 | 1,729,400 | 775,450 | 1,465,790 |
| වෙනත් ආදායම් | 2,110,000 | 1,682,430 | 1,170,193 | 628,608 | 150,000 | 33,310 | 22,440 | 116,371 |
| **එකතුව** | 10,033,200 | 7,472,648 | 7,058,644 | 3,565,004 | 6,081,600 | 7,838,806 | 5,792,233 | 3,151,000 |

### 2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

| | **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | ප්‍රාදේශීය සභා පනතේ 134 (1) වගන්තිය ප්‍රකාරව සභා බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශ කාලීනව හඳුනාගෙන වරිපනම් බදු අය කිරීමට සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. | තක්සේරු වාර්තා ලද පසු වරිපනම් බදු අයකිරීමට කටයුතු කරන බව. | පනත ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ව්‍යාපාර බදු රු. 154,760 ක් අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 152 (1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු කඩ කාමර 16 කින් ලැබිය යුතු කඩකාමර කුලී හා දඩ රු. 116,800 ක් සහ වාහන කුලී රු. 482,950 ක් අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 159 (1) වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරන බව. | ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සාමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාව සතු සතිපොළවල් 03 කින් ලැබිය යුතු පොළ බදු ආදායම් රු. 553,210 ක් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් ආරක්ෂිත ඇපයෙන් හා නීතිමය කටයුතු මඟින් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඉ) | බෙරලිහෙල කුඩා ගම්මාන 03 සතිපොළ බදු ගිවිසුමට අනුකූල නොවන ලෙස තෙවන පාර්ශවයක් වෙත බදු අයිතිය විකුණා තිබූ අතර බදු ගැනුම්කරු විසින් බදු ගිවිසුමේ කොන්දේසි උල්ලංඝනය කර තිබියදී සභාව ඒ පිළිබඳව අවධානය යොමුකර නොතිබුණි. | හිඟ බදු මුදල් අයකරගැනීම සඳහා ඉදිරියේ දී නඩු පැවරීමට කටයුතු කරන බව. | ගිවිසුමේ කොන්දේසි අනුව කටයුතු කළ යුතුය. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු බලපත්‍ර ගාස්තු රු. 166,750 ක් අයකර ගැනීමට ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | ගාස්තු අය කර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයතන 31 කින් ලැබිය යුතු දැන්වීම් පුවරු ගාස්තු රු. 1,228,590 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය. |
| (ඌ) | පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු පිළිවෙලින් රු. 378,654 ක් හා රු. 2,260,547 ක් විය. | හිඟ උසාවි දඩ හා මුද්දර ගාස්තු කඩිනමින් ගෙන්වා ගැනීමට කටයුතු කරන බව. | හිඟ ආදායම් ගෙන්වා ගැනීම කළ යුතුය. |

**2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ සුභසාධන කාර්යයක් ලෙස ජලය නොමිලේ සහ ගාස්තුවක් අයකරමින් සභා බල ප්‍රදේශය තුල බෙදා හරිනු ලබයි. සමාලෝචිත වර්ෂයේ ජල සැපයුම් ආදායම රු. 118,646 ක් වුවත්, ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයෙන් ජලය මිලදී ගැනීමට,ජලය බෙදාහැරීම හා ඉන්ධන වියදම වෙනුවෙන් දරා තිබූ මුළු වියදම රු. 1,794,449 ක් වූයෙන් ආදායමට වැඩි වියදම රු. 1,675,803 ක් වූ අතර ආදායමට සාපේක්ෂව මුළු වියදම15 ගුණයකින් වැඩි වී තිබුණි. | ඉදිරියේදී සුභසාධන කටයුත්තක් සේ සලකා අවමංගල්‍යා කටයුතු සඳහා පමණක් නොමිලයේ ජලය සැපයීමට කටයුතු කරන බව. | පිරිවැය ආවරණය වන මිලක් අයකර ගැනීම කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මතභේදයට තුඩුදෙන ගණුදෙනු**

| විගණන නිරීක්ෂණය<br>--------------------- | සභාවේ අදහස් දැක්වීම<br>--------------------- | නිර්දේශය<br>------------ |
|---|---|---|
| ප්‍රාදේශීය සභා අරමුදල් උපයෝගී කරගෙන ළමයින් සඳහා පාසල් උපකරණ මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී රු. 279,750 ක වියදමක් දරා තිබුණි. | | |

| | | |
|---|---|---|
| එසේ මිලදී ගත් පොත් ළමයින් සඳහා බෙදා දීම සිදු කර නොතිබූ අතර රු. 19,980 ක් බැගින් වූ පොත් කට්ටල 14 ක් සකස් කර සභාවේ සභිකයින් 14 දෙනා වෙත 2022 දෙසැම්බර් 14 දින ලබා දී තිබුණි. සභිකයින් විසින් එම පොත් ළමයින් සඳහා බෙදා දුන් බව තහවුරු කෙරෙන නාමලේඛන විගණිත දිනය වූ 2023 මාර්තු 16 දින වන විටත් ලබාදී නොතිබුණි. | මෙවැනි අතපසුවීම් ඉදිරියට නොවීමට කටයුතු කරන බව. | පොත් බෙදා දුන් බව තහවුරු කෙරෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය. |

**3.2 වත්කම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සභාව සතු ඉඩම් 61 ක, සුසාන භූමි 30 ක, ප්‍රජාශාලා 38 ක සහ වාහන 03 ක නීත්‍යානුකූල අයිතිය සභාව වෙත පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. | ඉඩම් සහ වාහන වල අයිතිය පවරා ගැනීමට කටයුතු කරමින් සිටින බව. | වත්කම් වල නීත්‍යානුකූල අයිතිය පවරාගත යුතුය. |
| (ආ) | සභාව සතු වාහන සහ යන්ත්‍ර 03 ක් 2018 හා 2019 වර්ෂයන් වල සිට අක්‍රීයව පැවති අතර ඒවා අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට සමාලෝචිත වර්ෂයේ අවසානය වන විටත් කටයුතු කර නොතිබුණි. | අපහරණ මණ්ඩල පත් කර මෙම වාහන අපහරණය කිරීමට කටයුතු කරන බව. | අක්‍රිය වත්කම් අළුත්වැඩියා කිරීම හෝ අපහරණය කළ යුතුය. |

**3.3 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.6.1 වගන්තියට අනුකූළ නොවන ලෙස එකතු වටිනාකම රු. 986,350 ක් වූ පෙරපාසල් සිසුන් සඳහා ක්‍රිඩා උපකරණ ඒකක 06 ක් මිලදීගෙන තිබුණි. තවද 2.8.4 වගන්තිය අනුව මෙම මිලදී ගැනීම් නියමිත ප්‍රමිතියට පවතීද යන්න හඳුනාගැනීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පත්කර වාර්තාවක් ලබාගත යුතු වුවත් එපරිදි කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිවැරදිව කටයුතු කිරීමට විෂය නිලධාරීන්ට උපදෙස් ලබා දුන් බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

**3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බෙරලිහෙල පොළ සංවර්ධනය කිරීමේ කර්මාන්තය සඳහා රු. 4,450,776 ක ගෙවීම් වාර්තාවක් සකස් කර රු. 445,077 ක අතරෑදවුම් මුදල් අඩුකර රු. 4,005,699 ක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණද කර්මාන්තය ක්‍රියාත්මක කිරීමේදී ඉටුනොකළ වැඩ සඳහා රු. 318,952 ක් වැඩිපුර ගෙවා තිබුණි. | රු. 127,570 ක් කොන්ත්‍රාත් සමිති වෙත රැඳවුම් මුදල් ගෙවීමේදී අයකර ගන්නා බව, ඉතිරියට අදාළව භාවිතා කළ මිල රේටයන් නිවැරදි බව. | වැඩිපුර කල ගෙවීම් අයකර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කර්මාන්ත පරික්ෂාව - 2021 ආදළව නිකුත් කළ 2022 මාර්තු 25 දිනැති අංක HMB/B/LPS/B4/2021/AQ/07 දරන විගණන විමසුම මඟින් පෙන්වා දී තිබූ කර්මාන්ත 04 කට අදාළව රු. 482,217 ක් අයකර ගැනීම හා ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට මුදල් රෙගුලාසි 155 හි සඳහන් විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. | කර්මාන්ත සදහා යන්ත්‍ර සමඟ මිනිස් ශ්‍රමය භාවිතා කිරීම හා භාවිතා කළ මිල රේටයන් නිවැරදි බව. | වැඩිපුර කල ගෙවීම් අයකර ගත යුතුය. |